ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016 ජූනි මස 05 වැනි දින |

## ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාගේ වියදම් සම්බන්ධයෙන් මාධ්‍යයන්හි පළ වන සාවද්‍ය තොරතුරු පිළිබඳ පැහැදිළි කිරීමක්

ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා විසින් සිය පුද්ගලික කටයුතු සඳහා මහජන මුදල් වැය කර ඇති බවට විපක්ෂයේ දේශපාලනඥයෙක් චෝදනා නගා තිබුණු අතර, ඒ පිළිබඳ ජන මාධ්‍ය ඔස්සේ ද ප්‍රසිද්ධියක් ලබා දී තිබුණි.

මහ බැංකු අධිපතිවරයා හෝ මහ බැංකු කාර්ය මණ්ඩලය විසින් හෝ පුද්ගලික වියදම් සඳහා එකදු සතයක් ලබා ගෙන නොමැත. කිසිදු අයථා හෝ නීති විරෝධී ආකාරයකින් මහජන මුදල් වියදම් කිරීමක් ද සිදු කර නොමැත.

මහ බැංකු අධිපතිවරයා සහ කාර්ය මණ්ඩලය සහභාගී වන ජාත්‍යන්තර හා දේශීය නිල රාජකාරි කටයුතුවල දී අදාළ වියදම් මහ බැංකුව විසින් දරනු ලැබේ. මෙය අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ද පවත්නා පොදු තත්ත්වයකි.

පසුගිය කාලය තුළ මහබැංකු අධිපතිවරයා සහ කාර්ය මණ්ඩලයට ලෝක බැංකුව (World Bank) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), කලාපීය සහයෝගිතාව පිළිබඳ දකුණු ආසියානු සංවිධානය (SAARC), අග්නිදිග ආසියානු මහ බැංකු කේන්ද්‍රය (SEACEN), ආසියානු නිශ්කාෂණ සංගමය (ACU) වැනි ආයතන විසින් වාර්ෂිකව පවත්වනු ලබන

ද්විපාර්ශ්වික රැස්වීම් සඳහා සහභාගී වීමට ද, ගරු අග්‍රාමාත්‍යවරයා සහ මුදල් අමාත්‍යවරයා සමග නිල සංචාර ගණනාවකට ද සහභාගී වීමට සිදුවිය. එසේම ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන ගණනාවක නියෝජිතයන් ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවන්හි ඔවුන්ට සත්කාර වියදම් දැරීමට ද සිදු විය.

මෙම සියලු වියදම් සිදු කර ඇත්තේ ශ්‍රී ලංකා ජනරජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකු නීති සහ රෙගුලාසි අනුව ය. රාජ්‍ය මුදල් රෙගුලාසි යටතේ නියම කර ඇති මූලධර්ම සහ කාර්ය පටිපාටීන්වලට අනුකූලව ය. මෙම වියදම් පිළිබඳ සංඛ්‍යාලේඛන, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ජනරජයේ විගණකාධිපතිවරයා විසින් විගණනයට ලක් කෙරේ. මහ බැංකු අධිපතිවරයා සහ කාර්ය මණ්ඩලයේ නිල සංචාර අරභයා සිදු කර ඇති මෙම වියදම් රෙගුලාසි කඩ කරමින් අයථා ලෙස සිදු කර ඇති බවට කිසිදු විගණන වාර්තාවක් ලැබී නොමැත.

එබැවින් මේ සම්බන්ධ සැබෑ තත්ත්වය මහජනතාවට ඉදිරිපත් කළ යුතුව ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් කරයි.

සැබැවින්ම සිදුවී ඇත්තේ නිල සංචාර සඳහා මහ බැංකු අධිපතිවරයා සහ කාර්ය මණ්ඩලයේ වියදම් අවම කර ගැනීම මිස අයථා ලෙස වියදම් වැඩි කරලීම නොවේ. 2014 වසරේ නිල සංචාර සහ ඊට ඇඳුණු කටයුතු සඳහා මහ බැංකු අධිපතිවරයා සහ කාර්ය මණ්ඩලය රුපියල් මිලියන 133.8 ක් වියදම් කර තිබේ. නමුත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමන්ගේ නායකත්වය යටතේ මූල්‍ය විනය තදින්ම ආරක්ෂා කිරීමට කැපවී සිටින මහ බැංකු අධිපතිවරයා සහ සමස්ත කාර්ය මණ්ඩලය 2015 වසරේ නිල සංචාර සහ ඊට ඇඳුණු කටයුතු සඳහා වියදම් කර ඇත්තේ රුපියල් මිලියන 96.6 ක මුදලකි. එය 2014 වසරට වඩා රුපියල් මිලියන 37.2 ක අඩුවීමකි.